# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
### (බාහිර) - 2009

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - **DMAT -E1015**

රංග කලාවේ මූලිකාංග

<u>ප්‍රශ්න පහකට (05)පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි | කාලය : පැය 03 යි

---

01. <u>**අවස්ථානුකෘතිර් නාට්‍යම්**</u>" ( අවස්ථානුකරණය නාට්‍යය යි) ධනංජය පඬිවරයාගේ මෙම නිර්වචනය නූතන නාට්‍ය කලාව අර්ථ දැක්වීමට කොතෙක් දුරට ප්‍රමාණවත් ද? සාකච්ඡා කරන්න.

02. රංග කලාවේ මූලිකාංග, අභිචාර විධි හා යාතුකර්ම ඇසුරින් පහළ වූ ආකාරය ඔබ දන්නා දෙස් විදෙස් නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න.

03. ප්‍රබන්ධ කථා රචනය හා නාට්‍ය රචනය අතර පවතින සමානතා හා වෙනස්කම් පිළිබඳ විග්‍රහයක් කරන්න.

04. නර්තනය, සංගීතය, සාහිත්‍යය වැනි කලාවන්ට සාපේක්ෂව නාට්‍ය කලාවේ පවතින ශක්‍යතා පිළිබඳ විමර්ශනයක් කරන්න.

05. " <u>ගැටුම</u> සාර්ථක නාට්‍යයක දැකිය හැකි මූලික ලක්ෂණයකි " විමසන්න.

06. නාට්‍යයක සංවාද / දෙබස් මගින් ඉටුවන කාර්යය පිළිබඳ විග්‍රහයක් කරන්න.

07. ඔබ නරඹන ටෙලි නාට්‍ය සමග සැසඳීමේ දී වේදිකා නාට්‍ය කලාව වෙනස් වන්නේ කවර අංශ වලින් ද යන්න නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

08. වර්තමාන ලෝකයේ නාට්‍ය කලාව, කවර අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා භාවිතයට ගැනෙන්නේ ද යන්න පරීක්ෂා කරන්න.

09. කෙටි සටහන් ලියන්න.
    (අ) අභිනය
    (ආ) කතා වස්තුව
    (ඇ) රංග ශෛලිය
    (ඈ) ප්‍රේක්ෂාව

**********************